# පෙරවදන

මිනිසාගේ ප්‍රධානතම ලක්ෂණය බවට පත්වන්නේ විෂය මූලික ලෝකය පරාවර්තනය කිරීම සහ එය ප්‍රතිනිර්මාණය කිරීම යි. එහි පදනම ගොඩනැගෙන්නේ මනස, සිත සහ විඥානය පදනම් කර කරගනිමිනි. මෙම ඉහත සංකල්ප තුනෙහි අර්ථ එකිනෙකට වෙනස්වන අතර ඒවායෙහි ක්‍රියාකාරීත්වය ද එකිනෙකට වෙනස්වනු දැකිය හැකි වේ. සන්නිවේදනය හටගැනීමේ මූලිකතම ඒකකය බවට පත් වන්නේ මනසයි. මනසින් තොර සන්නිවේදනයක් පිළිබඳ සාකච්ඡා කළ නොහැකි ය. එය විඥානය දක්වාම පුළුල් ස්ථර කේන්ද්‍රීයව පුද්ගලයා ඉදිරියේ සිටින මානව සහ භෞතික සාධක හා සබැඳෙමින් ක්‍රියා කරනු ඇත. සන්නිවේදනය නිරන්තරයෙන් ගොඩනැගෙන්නේ මිනිසා ඉදිරියෙහි සිටින මිනිසා සහ අනෙකුත් භෞතික සාධක පදනම්ව ය. ඒ අනුව සමාජයෙහි සැකැස්ම සහ එහි ව්‍යුහගත වීම ද සන්නිවේදනය කේන්ද්‍රීයව සිදුවන බව පැහැදිලි වේ. අනෙක් අතට සමාජ ක්‍රියාවලියෙහි හැඩරුව සහ ව්‍යුහීය ස්වරූප නිරන්තරයෙන් ගොඩනැඟෙන්නේ සන්නිවේදනය මූලිකව ය. සන්නිවේදනයෙන් තොර මනසක් හෝ ක්‍රියාවලියක් හෝ චින්තන ක්‍රමවේදයක් පුදගලයා හෝ සමාජය තුළ දැකිය නොහැකි වේ. මෙම සියල්ල මගින් පැහැදිලි වන්නේ සන්නිවේදනය යන්න මානව සමාජ ක්‍රියාවලියෙහි කේන්ද්‍රය සහ සියලු චලිතයන් නිෂ්පාදනය කරන ප්‍රබලතම ඒකකය බවයි. ඒ අනුව මානව මනසෙහි ප්‍රබලතම කාරණාව බවට පත්වන්නේ සන්නිවේදනයයි.

සන්නිවේදනය යන්න සීමාන්තික ලෙස පුළුල්ය. එය තනි ක්‍රියාදාමයකට, වස්තුවකට, හෝ ප්‍රපංචයකට සීමා නොවේ. එය මානව මනසෙහි ස්වාධීනව පැවැත්ම ප්‍රකාශ කළ හැකි ප්‍රබලතම ඒකකයයි. එය වාස්තවික ලෝකයෙහි පොදු ලක්ෂණ පිළිබඳ අදහස් ගොඩනගන අතරම එය මානව මනසෙහි ප්‍රාථමික පදාර්ථය බවට පත් වන ආකාරය ද දැකිය හැකි වේ. සන්නිවේදනය මගින් ලෝකය පිළිබඳ දැනුම ගොඩ නැගීම පමණක් නොව දැනුමෙහි ප්‍රභාව නිර්මාණය කරමින් මිනිස් බුද්ධියෙහි ක්‍රියාකාරීතම ක්ෂේත්‍රය බවට ද පත් වේ. එක් එක් ද්‍රව්‍ය, අර්ථ සහ ක්ෂේත්‍ර අඛණ්ඩ ලෙස සංයෝජනය සහ විසංයෝජනය සිදුකරන්නේ ද මානව මනසෙහි විඥානික කලාප කේන්ද්‍රීයව ය. ලෝකයෙහි ද්‍රව්‍යමය ඒකත්වය සහ එහි පැවැත්ම පමණක් නොව පැවැත්ම තුළ ගොඩනැගෙන විපරිණාමිතභාවය ද එහි පැවැත්ම සහ පැවැත්මෙහි සචලතාව පිළිබඳ යථාර්ථවාදී දෘශ්‍ය, විඥානය තුළ ගොඩනගන්නේ ද සන්නිවේදනයෙහි සක්‍යතා පදනම්ව ය.

සිත මනස සහ විඥානය යනු ද්‍රව්‍යයෙහි නිෂ්පාදිතයක් වන අතර එය මිනිසා වටා ඇති මානව සහ ද්‍රව්‍යමය ලෝකය සමඟ සන්නිවේදනය මගින් වෙන් කළ නොහැකි ලෙස බැඳී පවතී. එහි බලපෑමකින් තොරව මොළයට ක්‍රියාකාරී වීමට නොහැකි බව ද පෙනීයන අතරම එහි ප්‍රතිඵල ලෙස ද්‍රව්‍යමය ලෝකය පිළිබඳ දෘශ්‍ය නිෂ්පාදනය කිරීමේ ප්‍රබලතම හැකියාව ද ගොඩනගාගෙන තිබේ. එසේම යථාර්ථය ක්‍රියාශීලී ලෙස පිළිඹිබු කිරීමටත් ඒ මත පැවැත්ම පමණක් නොව කිසියම් වූ හෝ පරමාර්ථ කේන්ද්‍රීයව ඒවා මුදුන් පමුණුවා ගැනීමටත් අවශ්‍ය ජාති ලක්ෂණ සන්නිවේදනය තුළ ගැබ් ව තිබේ. ඒ අනුව මානව මනස තුළ උසස් ලෙස සංවිධානය වීම පමණක් නොව ඒවා පරාවර්තනය කිරීමෙන් ඒවායෙහි ජාති ලක්ෂණ ද සන්නිවේදනය තුළින් නිර්මාණය කළ හැකි වේ.

අනෙක් අතට සන්නිවේදනයෙහි ප්‍රබලතම මෙහෙවර භාෂාව බවට පත්වන අතර භාෂාව යනු චින්තනයෙහි සෘජු පිළිඹිඹුවක් ලෙසට ද ගොඩනැගේ. වචන ගොඩනැගෙන්නේ ද ද්‍රව්‍යාත්මක ස්පර්ශයක් තුළිනි. භාෂාව චින්තනය සකස් කරනවා පමණක් නොව එය භෞතිකයෙහි ස්වරූප සම්ප්‍රේෂණය සහ සංජානනය සඳහා ද හේතු කරගනී. වචන සහ වචන සංයෝජන මගින් මිනිසා වාස්තවික ලෝකය සංවේදනය කරගන්නවා පමණක් නොව එය මනෝමූලික ලෙස ප්‍රතිබිම්බ බවට ද පත් කර ගනී. අනතුරුව නිෂ්පාදිත එම පිළිබිඹුව බාහිර ලෝකයට අයත් නොවන අතර එහි උරුමය හිමිවන්නේ ද එහි නිෂ්පාදිතයා වන ඔහුටමය.

ඒ අනුව සන්නිවේදනය යන්න සරල නොවන අතර එය සමාජ හැඩගැස්ම සහ ප්‍රගමනයෙහි මූලික කාරක බවට ද පත් වේ. එය අතීතයට වඩා වර්තමානයෙහි මාධ්‍ය මූලිකව සංකීර්ණ ස්වරූප ගැනීමත් සමග මිනිසාගේ මානසික සහ චර්යාත්මක කාරණාවන්ගේ ද සංකීර්ණ ස්වරූප නිෂ්පාදනය කොට ඇති බව පැහැදිලි ය.

අද්‍යතන පශ්චාද් ගෝලීය සමාජ ක්‍රමවේදය තුළ සන්නිවේදනය සහ මාධ්‍ය ක්‍රියාවලිය මගින් සංකීර්ණ ස්වරූප කේන්ද්‍රීය වූ සංස්කෘතික අධිරාජ්‍යවාදයක් (Cultural imperialism) ද නිර්මාණය කොට තිබේ. මෙම සංස්කෘතික අධිරාජ්‍යවාදී ක්‍රමවේදය ජාතික සහ දේශීය සංස්කෘතික කාරණාවන්ට ප්‍රතිවිරුද්ධ වූ ප්‍රපංචයක් (Phenomenon) ලෙස හඳුනාගත හැකි වේ. මේ පිළිබඳ විවිධ විචාර සහ විවේචන තිබුන ද, මෙම ගෝලීය සංස්කෘතික ආධිපත්‍යයික ස්වරූප වර්තමානයෙහි යථාර්ථයක් බවට පත් වී තිබේ. තුන්වන ලෝකයේ රටවල් පමණක් නොව ලොව සියලු රටවල් විවිධ ස්වරූප තුළ මෙම ආධිපත්‍යයික ක්‍රමවේදයට මුහුණ දුන්න ද, තුන්වන ලෝකයේ සෑම රටවලටම එහි ගොදුරු බවට පත්වීමට සිදුව ඇති බැව් පෙනේ. මෙහිදී මිනිසාගේ අදහස්, මතවාද, අන්තර් ක්‍රියා සහ සමස්ත චර්යා පද්ධතීන්ගේ අනවරත වේගවත් චලිත කාලය සහ අවකාශය (Time and space) ද අතික්‍රමණය කරවමින් ගොඩනැංවීමට මෙම මාධ්‍ය ක්‍රියාවලියට හැකි ව තිබේ. ඉතිහාසයෙහි සංක්‍රමණ කේන්ද්‍රීයව සංස්කෘතික වෙනස්කම් සහ සම්මිශ්‍රන පිළිබඳව සාකච්ඡා කළ ද වර්තමානයෙහි ඒ පිළිබඳව සන්නිවේදනය සහ මාධ්‍ය මූලිකව සාකච්ඡා කිරීමට සිදුව තිබීම ගෝලීයකරණය විසින් සිදු කරනු ලැබ ඇති පරිවර්තනයකට වඩා ලෝකය පිළිබඳ බලය, ආර්ථිකය සහ යටත් කර ගැනීමේ මානසික අවශ්‍යතා සන්තෘප්තියෙහි ප්‍රතිඵල තුළින් ගෝලීයකරණය හා සබැඳිව නිර්මාණය කරන ලද ප්‍රතිඵල බව පැහැදිලි කරගත යුතු ය.

අද්‍යතන සංස්කෘතික ගෝලීයකරණ ක්‍රියාකාරීත්වය මගින් මානව ප්‍රතිරූප (Images) ගොඩ නැංවීම සහ බිඳවැට්ට වීම් පමණක් නොව පරිචිත (Practices) සහ සංචලනයෙහි විස්තාරයන් (Extensity) සහ එහි ප්‍රවේගයන් ද පාරජාතික අවකාශ (Transnational spaces) තුළ ගොඩ නගන ආකාරය අත්දැකිය හැකි අයුරින් සන්නිවේදනය සහ මාධ්‍ය ක්‍රමවේදය පරිවර්තනය වී ඇති නිසා පුද්ගල සංජානනය පමණක් නොව සමාජ සංස්කෘතික චර්යා පද්ධතියෙහිදී ද එම පරිචිත ලක්ෂණ ප්‍රතිපෝෂක චක්‍රයක් ලෙස ගොඩනැගෙන ආකාරය පැහැදිලි ය. මේ අනුව වර්තමානයෙහි කාලය සහ අවකාශය සීමාතික්‍රාන්ත ලෙස මෙම මාධ්‍ය මගින් හකුලුවා ඇති නිසා වර්තමානයෙහි වඩාත් වැදගත් වන්නේ දුර හෝ අවකාශය නොව ද්වි ආන්තික ලෙස ගොඩනගා ගනු ලබන සහසබඳතාව සහ එහි ස්වරූපයන් ය. ඒ අනුව භෞතික සහ මානව සාධකයන්හි ගොඩනැගෙන සත්‍ය දූරස්ත බවට වඩා සාපේක්ෂ වශයෙන්

ගොඩනගා ගනු ලබන දුර පිළිබඳ සවිඥානික වී ඇති බව පැහැදිලි වනවා පමණක් නොව මෙම සබඳතාවන්හි ශක්තිමත් බව රඳා පවතින්නේ ද සීඝ්‍රබව නමැති චර්යාත්මක කාරණාව මූලික වීමෙන් බව පැහැදිලි ය.

මේ මගින් ගොඩනැගෙන සංස්කෘතික වෙනස ප්‍රබල ය. සංස්කෘතිය නැමති සංකල්පයෙහි ප්‍රබල බලයක් කේන්ද්‍රගත වන ආකාරය ද දැකිය හැකි ය. සමස්ත මානව සමාජ චර්යාවෙහි මූලික ගතිකය බවට පරිවර්තනය වන්නේ සංස්කෘතික කාරණාවයි. ඒ අනුව සංස්කෘතියක අධිරාජ්‍යවාදී ක්‍රමවේදය යනු මානව සමස්ත චර්යාවේ මූලික ගතික පමණක් නොව සමස්ත චර්යාත්මක ස්වරූප ද එයට කේන්ද්‍රගත කරගැනීමකි. සංස්කෘතිය එක් අතකින් භෞතික බෙදාහැරීමේ කාරණාවක් (Culture as distribution of things) බවට පරිවර්තනය වන අතර තවත් අතකින් එය ජීවන චර්යාත්මක කාරණාවක් (Culture as a way of life) බවට පත් වේ. එමෙන්ම සංස්කෘතිය යන්න අර්ථ නිරූපණයන් ගොඩනගන සහ භෞතික සහ මානව චර්යාවෙහි අර්ථයන්හි හිමිකරුවා බවට ද (Culture as meaning) පත් වන්නකි. සෑම නිෂ්පාදිත අර්ථයකම හිමිකරුවා බවට පත්වන්නේ සංස්කෘතිය සහ එයට අදාළ ඉතිහාසයයි. සෑම ක්‍රියාවක් තුළම සංස්කෘතික අර්ථ නිෂ්පාදනය කරයි. සමස්තයක් ලෙස සංස්කෘතිය බලය බවට ද (Culture as power) පත් වේ. මේ අනුව සංස්කෘතියක හැඩගැස්වීම යනු බල කේන්ද්‍රීය මූලයක් බවට ද පරිවර්තනය වීමකි. ඒ අනුව අද්‍යතනයෙහි මාධ්‍ය විසින් ගොඩනගාගෙන ඇති සංස්කෘතික බලය විසින් මානව විඥානිකකාරනා සහ චර්යාත්මක කාරණා හැඩගැස්වීම සරල නොවන්නේ මාධ්‍යයෙහි මූලික චලිතය ආර්ථිකය සහ බලය කේන්ද්‍රීයව සිදුවන බැවිනි.

මේ අනුව වර්තමාන සන්නිවේදනය සහ මාධ්‍ය ක්‍රමවේද පාදකව දේශපාලන, ආර්ථික, සමාජ සංස්ථා සහ සංස්කෘතිකකාරණා කේන්ද්‍රීයව නිෂ්පාදන සම්බන්ධතාවන් සහ සිතුම් පැතුම් සහ ආයතනික ප්‍රතිඵලයන්හි වෙනස්වීමෙහි ස්වරූප තුළින් ගොඩනගනු ලබන දෘෂ්ටිමය ජීවිතය මානව ක්‍රියාවලිය තුළ ගැඹුරු පෙරළියක් ඇති කරමින් සමාජයක ස්වභාවික නියමානුකූල විපර්යාසයන් ද අතික්‍රමණය කොට ඇති බව පැහැදිලි ය. ඒ අනුව ඉතිහාසයෙහි අන් කවරදාකටත් වඩා අද්‍යතනයෙහි ගොඩනැගෙන මානව දෘෂ්ටිය වෙනස් ය. මෙලෙසින් ගොඩනැගෙන දෘෂ්ඨීන් සමාජයෙහි ද්‍රව්‍යමය බලය පමණක් නොව බුද්ධිමය බලය ද පාලනය කරන අයුරු දැකිය හැකි වේ.

මෙම ගොඩනැගෙන චර්යාත්මක පද්ධති යනු බලය සහ ධනවාදී ආකෘති වෙනස් ස්වරූපයකින් ප්‍රතිව්‍යුහගත වීමේ කාරනාවක් ලෙසින් ද අවබෝධ කරගත හැකි වේ. මේ අනුව වර්තමාන මාධ්‍ය තුළ ආර්ථික කරුණු මූලිකව ගොඩනගන පරිභෝජනවාදී සහ වාණිජකරණ ආකෘති පදනම් කරගෙන භාව ප්‍රබෝධක ඉන්ද්‍රියානුබද්ධ සංවේදක ලෝකයක් ජනවිඥානය තුළ කේන්ද්‍ර ගත කරනු දැකිය හැකි වේ.

මේ අනුව වර්තමාන මාධ්‍ය ක්‍රියාවලිය නිවැරදිව තේරුම් ගැනීමට සහ සමාජ සංවර්ධන ඉලක්ක සම්පාදනය කර ගැනීමට ලෝකයට සංකල්පීය, න්‍යායාත්මක සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම සහ අවබෝධය අත්‍යවශ්‍ය කොන්දේසියක් බවට පත්වී තිබේ. එම කොන්දේසි සපුරා ගැනීම පිළිබඳ ලංකාවේ සියලු ආයතන සවිඥානික විය යුතුවා පමණක් නොව, ඒ පිළිබඳව ක්‍රියාකාරී වීම ද අත්‍යවශ්‍ය සමාජ කාරණාවකි. ඒ අනුව ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් දැනුම සමාජගත කරමින්

පර්යේෂණාත්මක දිශානතියකට ජන විඥානය සකස් කිරීම අරමුණු කොටගෙන ගනු ලබන මෙවැනි ක්‍රියාමාර්ග අතිශය ප්‍රශංසනීය වන බව මෙහිදී සැලකිය යුතු ය.

මේ අනුව මෙම කෘතියෙහි සියලු කටයුතු සඳහා උපදේශකත්වය සැපයූ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර මහතාටත්, මෙම කටයුතු පිළිබඳ නිබඳව අධීක්ෂණය කරමින් අවශ්‍ය ප්‍රවේශ සම්පාදනය කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජෙනරාල් නාලක කළුවැව මහතාටත්, සහාය අධීක්ෂණ කටයුතු සිදුකරමින් නිබඳව අප ළඟ රැඳෙමින් මෙම වෙහෙස ආත්මීය කොට ගත් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හර්ෂ බී. අබේකෝන් මහතා සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙහි ප්‍රවෘත්ති නිළධාරිනී මානෙල් අතපත්තු මහත්මියටත්, නිබදව මේ සමග කටයුතු කළ ප්‍රේමරත්න ජයවර්ධන, ඩී. එන්. පී. ඩයස්, ආනන්ද ජයසිංහ, ඩබ්. ජී. ටී. පූර්ණිමා බණ්ඩාර, පී. ආර්. ටී. නිමේෂ් ඇතුළු ප්‍රවෘත්ති නිළධාරීන් සැමටත්, මෙහි පිටු සැකසුම් සහ මුද්‍රණය සිදුකළ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙහි අධිපති තුමා ඇතුළු සියලු දෙනාටමත් සංස්කාරක මණ්ඩලයෙහි අපි සැම හදපිරි සතුට ප්‍රකාශ කර සිටිමු.

**මහාචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්**

ප්‍රධාන සංස්කාරක
ජනමාධ්‍ය අධ්‍යයනාංශය
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය.